# අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගම් හා සාරධර්ම ඒකකයේ ඉදිරිපත් කිරීමකි

ඉදිරිපත් කිරීම

මොරටු මහා විද්‍යාලයේ ධර්මාචාර්ය ශාස්ත්‍රවේදී
පූජ්‍ය කුඹුක්ගොල්ලෑවේ සුමනසාර හිමි විසින්

# බෞද්ධ දේශපාලන මූලධර්ම පිළිබඳ විචාරශීලි අධ්‍යයනය

# බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය

- බෞද්ධ දේශපාලන මූලධර්ම අධ්‍යයනය පිළිබදව සාකච්ඡා කරන විට අවදානය යොමු විය යුතු ප්‍රධාන අංශ කිහිපයක් තිබේ ඒ ප්‍රතිපත්ති පහත සදහන් පරිදිය
  - පංචශීල ප්‍රතිපදාව
  - දසරාජ ධර්ම
  - සප්ත අපරිහාණීය ධර්ම
  - දස සක්විතිවත්
  - සතර සංග්‍රහවස්තුව
  - සතර අගති විරතිය
  - ලෝක පාලක ධර්ම
  - කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම
  - පාලන තන්ත්‍රය විෂයෙහි ප්‍රජා වගකීම

# පංචශීල ප්‍රතිපදාව

- රාජා භවතු ධම්මිකො
- රටේ පාලකයා ධාර්මික අයෙක් විය යුතු ය
- රජු ධාර්මික අයෙක්විමට අවශ්‍ය වන ප්‍රතිපදා අතරින් පංචශීලය වැදගත් වේ
- ශීලය යනුවෙන් දහමේ දැක්වෙන්නේ කය හා වචනයේ සංවර බවයි
- කායික වැරදි හා වාචසික වැරදිවලින් මිදීම ශීලය වේ
- කායික වැරදි ප්‍රාණඝාතය, සොරකම, කාමයවරදවා හැසිරීම වේ
- වාචසික වැරදි බොරුකීම, කේලාම්කීම්, හිස්වචන හා පරුෂවචන කීම වේ

- මෙම ප්‍රතිපදාව විශ්ව සාධාරණ වු ඉගැනවීමක් වේ
- ඒ ඉගැනවීම තුළින් මානව අයිතිවාසිකම් ආරක්ෂාවනු ඇත
- මෙම නිසාම මේ ප්‍රතිපත්තිය ධාර්මික රාජ්‍ය ප්‍රතිපදාවක් වශයෙන් හදුන්වා දී ඇත
- ඒ අනුව පාලකයා පස්පවින් වැළකී සිටිමින්, ප්‍රජාව ද ඉන් වළක්වාලීමට ක්‍රියා කළ යුතු ය
- මෙහි පස්පවින වැළකීම යනු පන්සිල් ආරක්ෂා කිරීම වේ
- එය බුදුදහම තුළ පංචසීලය හෙවත් ගේහසික සීලය වශයෙන්දැක් වේ
- එය ආරක්ෂා කිරීම රජුගේ වගකීමක් වේ.

# පළමු ශික්ෂා පදය ප්‍රාණඝාතයයි

- මෙම ශික්ෂා පදය රැකීම තුලින් ප්‍රාණඝාතය අතහරිනු ලබයි, අවිඅයුධ අතහරි, දඬුමුගුරු අතහරිනු ලබයි, ලැජ්ජා ඇතිව දයාවෙන් අවිහිංසාවෙන් කටයුතු කරයි එවිට සමාජය තුළ සයල්ලන්ගේම ජිවත්වීමෙ අයිතිය ආරක්ෂා වනු ඇත. පාලකයා මෙම ශික්ෂා පදය ආරක්ෂා කිරීම මගින් ජනතාවගේ පමණක් නොව මෘග පක්ෂීන්ගේ පවා ජිවිතාරක්ෂාව සිදු වේ අභය දානය ස්තීර වේ. එවිට රජය සරක්ෂිත වේ.

# දෙවන ශික්ෂාපදය අදත්තාදානය වේ

- මෙයින් නොදුන්දේ ගැනීම අර්ථවත් කෙරේ
- සොරකමින් ඉවත්වී දුන්දේ පමණක් ගෙන සතුටු වීම මෙයින් අපේක්ෂා කරයි.
- සොරසිතින් තොරව පිරිසිදු සිතින් කටයුතු කිරීම පාලකයාට යහපත්වන බව දක්වා ඇත.
- මෙම ප්‍රතිපත්තිය ආරක්ෂා කරන පාලකයාත් මහජනතාවත් මල් නොතලා රොන් ගෙන මී බදින්නා වු බඹරුන් මෙන්ම ද ඔවුනොවුන් නො පෙළා තුඹසක් බැදෙන්නාමෙන් රජය තුළ ධනය රැස් වේ

# තෙවන ශික්ෂා පදය වැරදි කාමසේවනයෙන් වැළකීම වේ

- මෙයින් වළකින තැනැත්තා කාමයේ වරදවා හැසරීමෙන් තොර වදුරාචාර යැයි කියන කාම සම්පත්වලින් ඈත්ව කටයුතු කරයි.
- සමාජය හා නීතිය විසින් පනවන ලද සම්මත සීමාවන් යටතේ පමණක් කම් සුවිඳීම.
- සීමා ඉක්මවන ලද විවාහ සම්බන්දතා නිසා සමාජය අප්‍රසන්න වන වා මෙන්ම සමාජය තුළ ගැටලු කාරී තත්ත්වයන් ද ඇති වේ. එම ක්‍රමය සමාජයට මෙන්ම පාලකයින්ට ද අහිත පිනිස බලපානු ඇත.
- පාලකයින් මෙන්ම පාලිතයින් මෙය ආරක්ෂා කරයි නම් එමගින් සමාජය තුළ සාමකමී පරිසරයක් මෙන්ම ප්‍රසන්න බවක් ඇති වේ
- මෙම ශික්ෂා පදය ආරක්ෂා කරීම මගින් තෘප්තිමත් විවාහ ජිවිතයක් ගත කළ හැකි පරිසරයක් සමාජය තුළ ඇති වේ එය රජුගේ වගකීමක් බව තහවුරු කර ඇත.

# හතරවන ශික්ෂා පදය මුසාවාදයෙන් වැළකී සිටීම.

- ඇත්ත කතා කරීම
- ලෝකයා මුළා නොකිරීම.
- පාලකයා සත්‍යවාදී වීම තුළින් ජනතා ප්‍රසාදය ඇති වේ, රජුගේ වදන් ජනතාව විශ්වාස කරයි. ඔහු වටා පිරිස ඒකරාශී වේ.
- සතර සංග්‍රහවස්තුව තුළත් මෙය ඇතුළත්ව ඇති ප්‍රියවචනය බුදුන් වහන්සේගේ බුද්ධචරිතයෙනුත් හමුවේ.
- එසේම සත්‍ය දැනගැනීමේ මානව අයිතිය ද ආරක්ෂා වේ.

# පස්වන ශික්ෂා පදය මදයට ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකීම වේ.

- ධනය විනාෂයට හේතවක් වේ
- පිරිහීමට හේතු වේ.
- වැරදි බහුලවීමට හේතු වේ.
- කායික රෝග මෙන්ම මානසික දුබලතා ඇති වේ.
- සිහිමද පුද්ගලයින්ගෙන් දක්නට ලැබෙන මානසික දුබලතා මෙය ආරක්ෂා කරීමෙන් දක්නට නොලැබේ
- පාලකයා ද මදයට හෝ ප්‍රමාදයට හේතුවන සුරාව පානය කරන්නේ නම් රාජ්‍යයේ පරිහානියට හේතුවකි. එමනිසා ජනතා හා සමෘද්ධිය ඔහුගෙන් ඉවත්ව යයි.

- පන්සිල් රැකීම නිසා රජු අනුන්ගේ ජීවිතවලට ගරු කරන, අනුන්ට අභය දානය දෙන, අනුන්ගේ දේපළ අයිතියට ගරු කරන, අනුන්ගේ පවුල් ජීවිත සුරකින, එහි ස්වාධීනත්වයට ගරු කරන, පුද්ගලාන්තර විශ්වාසය සුරකින, අනුන් රැවටීමෙන් තොර, මද්‍යසාර භාවිතයෙන් වළකින, සාමය, සෞඛ්‍යය, රැක ගැනීමට කැප වන පුද්ගලයකු සේ ක්‍රියා කරයි.

- මෙම පංචසීල ප්‍රතිපදාව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු යැයි බුදුදහමේ දැක්වෙ.

- සක්විති රජු විදේශයන්හි පාලකයන් ද පස්පවින් වළක්වා, පන්සිල් රකින පුද්ගලයන් බවට පත් කර ගනු ලබයි.